ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 සැප්තැම්බර් 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්**,** ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
භාණ්ඩාගාර මුද්‍රිත SA-52 අනුව අත්තිකාරම් ලැබීම් රු.807,918ක් වුව ද, එම වටිනාකම සටහන් නොකිරීම හේතුවෙන් ආදායම් නොවන ලැබීම්හි මුළු වටිනාකම එම අගයෙන් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.	පෙර වර්ෂවල දී අවසාන ගිණුම් සැකසීමේ දී අත්තිකාරම් ගිණුම් ලැබීම් සටහන් කිරීම් සම්බන්ධව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි ගිණුම් පිළියෙල කරන ලදී. ඔබ විසින් දක්වා ඇති නිරීක්ෂණය සම්බන්ධව කරුණු වැඩිදුරටත් සොයාබලා ඉදිරි වර්ෂයේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ.	භාණ්ඩාගාර මුද්‍රිතයන්හි වටිනාකම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතු ය.

(ආ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 04 වන වගන්තිය අනුව සියලුම රජයේ ආයතන මූල්‍ය නොවන වත්කම් වාර්තාකරනයේ දී රු.5,000 හෝ ඊට වැඩි වටිනාකමක් සහිත මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන වාර්තාකළ යුතු වුව ද, රු.5,000ට	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ ගිණුම් රෙගුලාසි අනුව ආයතනයේ ස්වභාවය හා ප්‍රමාණයන් මත රු.5000ට අඩු අයිතම වත්කම් තක්සේරු කිරීමේ දී සලකා බැලෙන බැවින්, වත්කම් වාර්තාවන්හි අගයන් සංශෝධනය කිරීම ගැටලු සහගත බැවින් 2025 වසරේ සිට ඉදිරියේ දී රු.5000ට අඩු	පාරිභෝගික ද්‍රව්‍ය වත්කම් ලෙස ගිණුම්ගත නොකළ යුතු ය.

	අඩු රු.229,160ක් වටිනා පාරිභෝගික භාණ්ඩ අයිතම 501ක් මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි.	පාරිභෝගික ද්‍රව්‍ය වත්කම් යටතට නොගෙන කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව තීරණය කරන ලද බව කාරුණිකව දැනුම් දෙමි.	
(ii)	නව CIGAS වැඩසටහන දෙපාර්තමේන්තුව තුළ 2024 වර්ෂයේ සිට භාවිතා කිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු මූල්‍ය නොවන වත්කම් තක්සේරුකර තිබුණි. ඒ අනුව, විගණනය වෙත ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාව අනුව වෙනත් යන්ත්‍ර හා උපකරණවල එකතුව රු.34,495,611ක් වුව ද, රු.33,947,340ක් ලෙස රු.548,271ක් අඩුවෙන් භාණ්ඩාගාර මුද්‍රිත SA-82හි දක්වා තිබුණි.	ඔබගේ නිරීක්ෂණය සමග එකඟ වෙ. 2025 වසරේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	භාණ්ඩාගාර මුද්‍රිත SA-82හි වටිනාකම නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතු ය.

(ඇ) අග්‍රිම ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැරකිරීම් කිසිවක් නොමැති වුව ද, රු.807,918ක් ලෙස අග්‍රිම ගැළපුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.	ඔබගේ නිරීක්ෂණය පිළිබඳ වැඩිදුරටත් කරුණු සොයාබලා අවශ්‍ය සංශෝධනයන් ඉදිරි වර්ෂයේ දී කිරීමට අපේක්ෂා කෙරේ.	නිවැරදි ලෙස සටහන් කළ යුතු ය.
(ii)	භාණ්ඩාගාර මුද්‍රිත SA-71 අනුව වෙනත් මූලාශ්‍රවලින් අග්‍රිම ලැබීම් රු.875,852ක් වුව ද, ACA-3 ආකෘතියෙහි එම අගය ඇතුළත්කර නොතිබුණි.	ඔබගේ නිරීක්ෂණය සමග එකඟ වෙ. 2025 වසරේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ACA-3 ආකෘතියෙහි SA-71 අනුව ලැබීම් නිවැරදිව සටහන් කළ යුතු ය.
(iii)	භාණ්ඩාගාර මුද්‍රිත SA-71 අනුව වියදම් මගින් අග්‍රිම පියවීම රු.17,737,902ක් වුව ද, රු.16,862,050ක් ලෙස රු.875,852ක් අඩුවෙන් ACA-3 ආකෘතියෙහි දක්වා තිබුණි.	ඔබගේ නිරීක්ෂණය සමග එකඟ වෙ. 2025 වසරේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ACA-3 ආකෘතියෙහි SA-71 අනුව ලැබීම් නිවැරදිව සටහන් කළ යුතු ය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයන් 16ක හා මූලධන වැය විෂයන් 02ක ප්‍රතිපාදිත රු.24,360,000කින් රු.5,424,385ක් ඉතිරි වී තිබුණු අතර, එය සියයට 12 සිට සියයට 99 දක්වා වූ පරාසයක විහිදී තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය හඳුනානොගෙන ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.	පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කරන ලද්දේ ඊට පෙර වර්ෂවල දී (2023) දෙපාර්තමේන්තු වියදම්වල උච්චාවචනයන් සැලකිල්ලට ගනිමිනි. නමුත් ප්‍රායෝගිකව එක් එක් වැය විෂයන් සඳහා 2024 මුදල් වර්ෂයේ දී 2023 වර්ෂයට සාපේක්ෂව එම වියදම් උද්ගත නොවීම මත ප්‍රතිපාදන ඉතිරිවීම් සිදු විය.	නිසිඅධ්‍යානයකින් හා සකසුරුවම්භාවයෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.
(ආ)	පුනරාවර්තන වැය විෂය 02ක එකතුව රු.100,000ක් වූ ප්‍රතිපාදන මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.	පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කරන ලද්දේ ඊට පෙර වර්ෂවලදී (2023) දෙපාර්තමේන්තු වියදම්වල උච්ඡාවචනයන් සැලකිල්ලට ගනිමිනි. නමුත් ප්‍රායෝගිකව එක් එක් වැය විෂයයන් සඳහා 2024 මුදල් වර්ෂයේදී 2023 වර්ෂයට සාපේක්ෂව එම වියදම් උද්ගත නොවීම මත ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුවිය.	නිසි සැලකිල්ලෙන් හා සකසුරුවම්භාවයෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.
(ඇ)	235-1-1-0-1403/0-11 වැය විෂය සඳහා මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් යටතේ රු.500,000ක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම ප්‍රමාණය සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. ඒ අනුව එම වැය විෂයෙහි	වසර මැද නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් අප වෙත යොමුකරන ලද ප්‍රතිපාදන ඉල්ලුම් කරන ලිපියට අනුව ඉදිරි මාස කිහිපය සඳහා ජල විදුලිය හා ආරක්ෂක සේවා වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන මාරුකිරීම් කළ යුතු ය.

	වියදම් නොවී ඉතිරි වූ මුළු ප්‍රතිපාදනය රු.570,190ක් වී තිබුණු අතර, වියදම් කළමනාකරණය කිරීමේ චක්‍රලේඛනයට අනුගතව වියදම් සීමාකිරීම් ලෙස හේතු දක්වා තිබුණ ද, මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීමේ දී අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ප්‍රතිපාදන මාරුකර තිබුණි.	එම මාරුකිරීම සිදුකරන ලදී. කරුණු එසේ වුව ද, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පූර්වේක්ෂණය කරන ලද මුදල සත්‍ය ලෙස පැන නොනැගීම මත මෙම ඉතිරිවීම් සිදුවිය. එය අප දෙපාර්තමේන්තු පාලනයෙන් තොර තත්ත්වයකි.	
(ඇ)	වැය විෂයන් 05ක එකතුව රු.3,105,694ක ඉතිරිවීම් සඳහා 2024 වර්ෂයේ වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයෙන් ඉතිරි වූ ප්‍රමාණය ලෙස හේතු දක්වා තිබුණ ද, මෙම වැය විෂයන්හි ඉතිරිවීම්වලට හේතු සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් කරුණු මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත්කර නොතිබුණු අතර, අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.	පුනාවර්තන හා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කරන ලද්දේ ඊට පෙර වර්ෂවල දී (2023) දෙපාර්තමේන්තු වියදම්වල උච්ඡාවචනයන් සැලකිල්ලට ගනිමිනි. නමුත් ප්‍රායෝගිකව එක් එක් වැය විෂයන් සඳහා 2024 මුදල් වර්ෂයේ දී 2023 වර්ෂයට සාපේක්ෂව එම වියදම් උද්ගත නොවීම මත ප්‍රතිපාදන ඉතිරිවීම් සිදු විය.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.
(ඉ)	235-1-1-0-1203-002/11 වැය විෂයෙහි රු.30,000ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 60ක ඉතිරිවීම් සඳහා 2024 වර්ෂයේ වෙන්කළ ප්‍රතිපාදනයෙන් වැය වූ ප්‍රමාණය ලෙස හේතු දක්වා තිබුණි. නිලඇඳුම් දීමනාව සඳහා හිමිකම් සහිත අනුමත නිලධාරීන් සංඛ්‍යාව 07ක් වුව ද, ඒ පිළිබඳ සලකා බැලීමකින් තොරව ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික සේවයේ නිලධාරී පුරප්පාඩු 2024 වර්ෂයේ නව බඳවාගැනීම්වලින් සපුරනු ඇතැයි බලාපොරොත්තු වුව ද, රජයේ ප්‍රතිපත්ති මත නව බඳවාගැනීම් සිදුනොවීම මත නිල ඇඳුම් දීමනා වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරි විය.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.
(ඊ)	235-1-10-1506-0/11 වැය විෂයෙහි ඉතිරිවීම සියයට 99.25ක් වූ අතර, එම ඉතිරිවීම්වලට හේතු ලෙස දැනට දේපළ ණයපොළී ඉල්ලුම්කර ඇති හා සුදුසුකම් සපුරා ඇති සියලු නිලධාරීන්ට ලබාදුන් පසු ඉතිරිය ලෙස දක්වා තිබුණි. ඒ අනුව, රජයේ සේවකයන් සඳහා දේපළ ණයපොළී අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.	පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කරන ලද්දේ ඊට පෙර වර්ෂවල දී (2023) දෙපාර්තමේන්තු වියදම්වල උච්ඡාවචනයන් සැලකිල්ලට ගනිමිනි. නමුත් ප්‍රායෝගිකව එක් එක් වැය විෂයන් සඳහා 2024 මුදල් වර්ෂයේ දී 2023 වර්ෂයට සාපේක්ෂව එම වියදම් උද්ගත නොවීම මත ප්‍රතිපාදන ඉතිරිවීම් සිදු විය.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.

(උ)	වැය විෂයන් 03ක රු.447,381ක ඉතිරිවීම් සඳහා දෙසැම්බර් මාසයට අදාළ වියදම ලෙස හේතු දක්වා තිබුණ ද, දෙසැම්බර් මාසයට අදාළව එම වැය විෂයන් 03 සඳහා එකතුව රු.65,253ක වියදම් දැරීමෙන් පසු රු.382,128ක ප්‍රතිපාදන තවදුරටත් ඉතිරි වී තිබුණි.	පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කරන ලද්දේ ඊට පෙර වර්ෂවල දී (2023) දෙපාර්තමේන්තු වියදම්වල උච්ඡාවචනයන් සැලකිල්ලට ගනිමිනි. නමුත් ප්‍රායෝගිකව එක් එක් වැය විෂයන් සඳහා 2024 මුදල් වර්ෂයේ දී 2023 වර්ෂයට සාපේක්ෂව එම වියදම් උද්ගත නොවීම මත ප්‍රතිපාදන ඉතිරිවීම් සිදු විය.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.

3.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතෙහි 7(1) ඡේදය	3,975	අයකර ගන්නා ලද රු.3,975ක් වටිනා මුද්දර ගාස්තු සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සෑම කාර්තුවක් අවසන් වී දින 15ක් ඇතුළත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුව ද, එසේ කටයුතුකර නොතිබුණි.	ඉදිරියේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස අදාළ විෂයය භාර නිලධාරින්ට උපදෙස් දෙන ලදී.	පනත ප්‍රකාරව මුද්දර ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතු ය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 238 (5) වගන්තිය	1,744,263	මාසික වැටුප් ලබාගන්නා එක් එක් නිලධාරියා විසින් වැටුප් සටහන්පත්‍රයේ අත්සන් තබා ඇති බව වැටුප් ගෙවන නිලධාරින් විසින් තහවුරුකර ගත යුතු වුව ද, අවස්ථා 23ක දී එකතුව රු.1,744,263ක වැටුප් ගෙවීම් වෙනුවෙන් නිලධාරින් වැටුප් සටහන්පත්‍ර අත්සන්කර නොතිබුණි.	වැටුප් සටහන් පත්‍ර වැටුප් ගෙවීමේදී ගන්නා ලෙසට විෂය භාර නිළධාරිනිය දැනුවත් කරන ලදී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වැටුප් සටහන්පත්‍ර අත්සන් කිරීමට කටයුතු කළ යුතු ය.

(ඇ)	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ යේ 3.1 වගන්තිය	CIGAS ඩෙක්ස්ටොප් යෙදුම මඟින් උත්පාදනය කරන ශේෂ පිරික්සුම ඇමුණුමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට අමුණා තිබිය යුතු වුව ද, එය අමුණා නොතිබුණි. එමෙන්ම නව CIGAS වෙබ්යෙදුම් පද්ධතියෙන් ලබාගත් අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන වන SA 10, 12, 50, 51 හා 90 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර නොතිබුණු අතර, නව CIGAS වෙබ්යෙදුම මඟින් ජනනය කරන ලද සම්මුවිත බැඳීම් හා බැරකම් වාර්තාව ඇමුණුම (iii) වෙනුවට ඇතුළත් කළ යුතු වුව ද, එසේ අමුණා නොතිබුණි.	ඉදිරි වසරවල දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ යුතු යැයි සඳහන් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය තුළ නීති ප්‍රතිසංස්කරණ කාර්යයන් 04ක් ක්‍රියාත්මකකර තිබුණු අතර, මෙය 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර නොතිබුණි. මේ තුළ ඇතුළත් බංකොලොත්භාවය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ කාර්යය ආරම්භකර තිබුණේ 2023 ජුනි 26 වන දින ය.	නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත්තේ නීති කොමිෂන් සභාව වෙත අවශ්‍ය පරිපාලනමය සහාය ලබාදීමටයි.ඒ අනුව දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම ලෙස දක්වනු ලබන්නේ වාර්ෂික මූල්‍ය සැලැස්මයි. එයට අන්තර්ගත වන්නේ ප්‍රාග්ධන වියදම් පිළිබඳ සැලැස්මයි. නීති කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වන්නේ නීති පර්යේෂණ කටයුතු පිළිබඳ වාර්ෂික සැලැස්ම වන අතර, එය මූල්‍යමය අගයකින් දැක්වීමට නොහැකි අතර, නීති කොමිෂන් සභාව විසින් සැලසුම් කරන නීති ප්‍රතිසංස්කරණ යෝජනා පිළිබඳ භෞතික අගයන් දැක්වෙන සැලැස්මකි. ඒ අනුව 2024 වර්ෂයේ	වර්ෂය තුළ කිරීමට නියමිත කාර්යයන් එම වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු ය.

		කාර්යසාධනය පිළිබඳ සැලැස්ම අධිකරණ අමාත්‍යාංශයේ සැලසුම් අංශයට දෙපාර්තමේන්තුව විසින් කාර්තුමය වශයෙන් යොමුකරනු ලබයි. බංකොලොත්භාවය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණය හා අදාළ කැබිනට් පත්‍රිකාව නිකුත්කොට ඇත්තේ 2023/06/07 දින වන අතර, එය අධිකරණ අමාත්‍යාංශය අප වෙත යොමුකළ වහාම ඉන්පසු පැවති පළමු නීති කොමිෂන් සභා රැස්වීම 2023/06/26 දින පැවැත් වූ අතර, එම කැබිනට් පත්‍රිකාවේ සඳහන් නීති ප්‍රතිසංස්කරණ අනුකමිටුවක් පත්කොට ඉදිරි කටයුතු ආරම්භ කරන ලදී.	
(ආ)	දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ආයතනයේ කාර්යභාරය හා අරමුණු ඇතුළත් වන පරිදි පිළියෙලකර නොතිබුණු අතර, කාර්යසාධන දර්ශක ආයතනයේ කාර්යභාරය හා අරමුණු මත පදනම්ව හඳුනාගැනීමට කටයුතුකර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම ආයතනයේ කාර්යභාරය හා අරමුණු හඳුනාගනිමින් සකස් කොට අධිකරණ අමාත්‍යාංශයේ සැලසුම් අංශය වෙත යොමුකරන අතර කාර්තුමය වශයෙන් එහි ප්‍රගතිය වාර්තා කරනු ලබයි.	ක්‍රියාකාරී සැලැස්මට ආයතනයේ කාර්යභාරය ඉටුකරන ආකාරය ඇතුළත් වන පරිදි පිළියෙල කළ යුතු ය.

4.2 කාර්යභාරයන් ඉටුනොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
1969 අංක 03 දරන නීති කොමිෂන් සභා පනතේ 05 වන වගන්තිය ප්‍රකාරව නීති අධ්‍යාපනය සම්බන්ධයෙන් නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව පනත ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ නිලවෙබ් අඩවියේ පෙර නීති කොමිෂන් සභා පර්යේෂණ වාර්තා මෙන්ම වර්තමානයේ නීති කොමිෂන් සභා පර්යේෂණ වාර්තා මහජනයා, ශිෂ්‍යයන් හෝ නීති පර්යේෂණ සිදු කරන ඕනෑම කෙනෙකුට පරිශීලනය කළ හැකි පරිදි යාවත්කාලීන කොට උඩුගතකර ඇත. එමගින් නීති කොමිෂන් සභාවේ අනුකාර්යන් ලෙස දක්වා ඇති නීති අධ්‍යාපනය සඳහා දායකත්වය සපයනු ලැබේ. නීති	නීති අධ්‍යාපනය සම්බන්ධයෙන් පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

	අධ්‍යාපනය සඳහා නීති අධ්‍යාපන සභාව (නීති විද්‍යාලය) මූලික බලතල ලබා දී පිහිටුවා ඇති බැවින් නීති අධ්‍යාපනය සම්බන්ධව නීති කොමිෂන් සභාවට සෘජු වගකීමක් නොමැති බවට වැඩිදුරටත් දන්වා සිටිමි.	

4.3 රජයේ නිලධාරින් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරින් ද රජයේ ගිණුමට අදාළ වවුචර සහතික කරන, චෙක්පත් අත්සන් කරන අය ද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇපආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇපතැබිය යුතු නිලධාරින් දෙදෙනෙකු ඇපතබා නොතිබුණි.	මෙම නිරීක්ෂණයේ සඳහන් නිලධාරින් දෙදෙනාගේ ඇප තැන්පතු සම්බන්ධ අයදුම්පත් හා අදාළ ලේඛන අධිකරණ අමාත්‍යාංශය වෙත දෙවරක් යොමු කළ අතර, එම දෙවතාවේම යම් යම් අඩුපාඩු සඳහන් කරමින් නැවත අප වෙත යොමුකර ඇත. එම අඩුපාඩු සකසා නැවත අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

4.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුති පනතේ විධිවිධාන සංශෝධනය කිරීම හා හවුල්	නීති ප්‍රතිසංස්කරණ අවසන් කිරීම සඳහා සැළකිය යුතු කාලයක් ගත වන අතර, එම නීති ප්‍රතිසංස්කරණ යෝජනා සම්බන්ධව තවදුරටත්	කාර්යභාරයන් ඉටු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු ය.

	ව්‍යාපාර නීතියට අදාළ සංශෝධන යන නීති ප්‍රතිසංස්කරණ කාර්යයන් දෙක 2024 වර්ෂයේ පළමු කාර්තුව තුළ ආරම්භකර තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් අවසන්කර නොතිබුණි.	සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවය ඉස්මතුවීම මත එම ප්‍රතිසංස්කරණ ඉදිරියට පවත්වාගෙන යන ලදී.	
(ආ)	2024 ජනවාරි 18 දින පවත්වනු ලැබූ කොමිෂන් සභා රැස්වීමේ දී 2024 වර්ෂය සඳහා රැස්වීම් වාර 12ක් පැවැත්වීමට සාමාජිකයන් එකඟ වී තිබුණ ද, සමාලෝචිත වර්ෂය සඳහා රැස්වීම් වාර 08ක් පවත්වා තිබූ අතර, ඒ සඳහා කොමිෂන් සභා සාමාජිකයන් 14දෙනාගෙන් 05දෙනෙකු කිසිදු රැස්වීමකට සහභාගී වී නොතිබුණි. මේ අනුව, රැස්වීම් සඳහා සාමාජික සහභාගීත්වය අවමවීම තුළින් නීති කොමිෂන් සභාවේ කාර්යයන් කඩිනමින් කරගෙන යාමට බාධාවක් වී තිබුණි.	එවැනි සාමාජිකයන්ගේ සාමාජිකත්වය අහෝසිවීම පිළිබඳව නීති කොමිෂන් සභා පනතෙහි විධිවිධානයන් නොමැතිවීම මේ පිළිබඳ ඉදිරි පියවර ගැනීමට බාධාවක් බව ද නීති කොමිෂන් සභා රැස්වීම් වාර්තාවල දක්වා ඇත. තව ද, මේ වන විට නීති කොමිෂන් සභාවේ නිලකාලය අවසන් වී ඇති බැවින් නැවත නීති කොමිෂන් සභාව පිහිටුවීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කොට ඇති අතර, එම ඉල්ලීම සාමාජිකයන්ගේ 2023/2024 පැමිණීම් පිළිබඳ වාර්තාවක් ද සලකා බැලීම සඳහා අධිකරණ අමාත්‍යාංශ ලේකම්තුමිය වෙත යොමුකොට ඇත.	පාලන මණ්ඩල සාමාජිකයන් රැස්වීම් සඳහා සහභාගී කරවීමට ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ඇ)	වැටුප් රහිත නිවාඩු ලැබ සිටින නිලධාරියකුගෙන් වර්ෂ 1-3ත් අතර කාලයක සිට අයවිය යුතුව පවතින ආපදා ණයශේෂය රු.162,500ක් වී තිබුණි.	උක්ත නිලධාරියා විසින් 2025/02/14 දින දෙපාර්තමේන්තුව වෙත ලිපියක් ඉදිරිපත් කොට ඇති අතර, ඔහු මේ වන විට ලබාගන්නා වෛද්‍ය ප්‍රතිකාර අවසන් වූ වහාම සේවයට වාර්තා කරන බව දන්වා එවා ඇත. කරුණු එසේ වුව ද, මෙම වසරේ තෙවන කාර්තුව වන විටදීවත් ඔහු සේවයට නොපැමිණියහොත් ණයශේෂය පියවන ලෙස ලිඛිතව දැනුම්දීමට අදහස්කර ඇත.	ණයශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජ්‍යෙෂ්ඨ මට්ටම තුළ ඇතුළත් සහකාර ලේකම් තනතුරෙහි අනුමත සේවක සංඛ්‍යාව 04ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 01ක් වූයෙන් පුරප්පාඩු 03ක් පැවතිය ද, එම තනතුරු පිරවීම අවශ්‍ය නොවන බව ලේකම් විසින් දන්වා තිබුණි.	ජ්‍යෙෂ්ඨ මට්ටම තුළ පවතින පුරප්පාඩු තුන දැනට පවතින රාජකාරී ධාරිතාව අනුව පිරවීම අවශ්‍ය නොවේ.	අවශ්‍ය නොවන තනතුරු යටපත් කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	ද්විතීක මට්ටම තුළ අනුමත සේවක සංඛ්‍යාව 15ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 06ක් වූයෙන් පුරප්පාඩු 09ක් පැවතුණි. මේ තුළ ගිණුම් සහකාර එක් තනතුරක් ද, සංවර්ධන නිලධාරි තනතුරු 01ක් ද, කළමනාකරණ සහකාර තනතුරු 06ක් ද, ලඝුලේඛක තනතුර ද පුරප්පාඩු වී තිබුණි. නමුත් ලඝුලේඛක තනතුර යටපත් කළ හැකි තනතුරක් ලෙස ලේකම් විසින් දන්වා තිබුණි.	ගිණුම් සහකාර තනතුර පුරප්පාඩු වුව ද, එය අධිකරණ අමාත්‍යාංශය තුළ පැවති සීමිත තනතුරක් (close service) වන අතර, වෙනත් සේවාවල නිලධාරින්ගෙන් එම පුරප්පාඩුව පිරවිය නොහැක. සංවර්ධන නිලධාරී තනතුරු 01 සහ කළමනාකරණ තනතුරු 06 පුරප්පාඩු අවම වශයෙන් හෝ සැපිරීම අත්‍යාවශ්‍ය වේ. ලඝුලේඛක තනතුර වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය නොවන අතර යටපත් කළ හැකි තනතුරකි.	රාජකාරී ඉටුකිරීමට අවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරිවීමටත් යටපත් කළ යුතු තනතුරු යටපත් කිරීමටත් කටයුතු කළ යුතු ය.
(ඇ)	ප්‍රාථමික මට්ටම තුළ ඇතුළත් රියදුරු තනතුරෙහි අනුමත සේවක සංඛ්‍යාව 04ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 02 වූයෙන් පුරප්පාඩු 02ක් පැවතුණි.	රියදුරු පුරප්පාඩු 02 ඉතා අත්‍යාවශ්‍ය වේ. ඉහත කරුණු පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයේ පැවති කාර්යමණ්ඩල සමාලෝචන රැස්වීමේ දී ද දැනුම් දුන් අතර, අවශ්‍ය පුරප්පාඩු රජයේ ප්‍රතිපත්තිමය කාරණා මත මේ වන විටත් සපුරාගත නොහැකි වී ඇත.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය.